**unit**
**01**

වාගීෂ්වර

**Part 01**

# දේශපාලන විද්‍යාවේ ස්වභාවය

- දේශපාලන විද්‍යාව ඉගෙනීමේ අරමුණු
- මිනිසා දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය
- දේශපාලනය යනු කුමක්ද?
- දේශපාලන විද්‍යාව හඳුනාගැනීම.
- දේශපාලනය හා දේශපාලන විද්‍යාව

**s u r e k a   w a g e e s h w a r a**

# දේශපාලන විද්‍යාව ඉගෙනීමේ අරමුණු

# දේශපාලන විද්‍යාව ඉගෙනීමේ අරමුණු
**(ප්‍රයෝජන / වැදගත්කම / උපයෝගීතාවය)**

ප්‍රවේශය

දේශපාලන විද්‍යාව සමාජීය විද්‍යාවකි (Social Science ). සමාජය පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විද්‍යාවකි. දේශපාන විද්‍යාවේ පියා , නිර්මාතෘවරයාට අනුව,

> **"දේශපාලන විද්‍යාව සියලුම සාමාජීය විද්‍යාවන් අතුරින් පැණිතම හා අග්‍රගන්‍යමය සාමාජීය විද්‍යාවේ."**
>
> **"දේශපාලන විද්‍යාව ස්වාමි (පීතෘ) විද්‍යාව වේ. "**
>
> **"දේශපාලන විද්‍යාව අධිපති විද්‍යාව වේ. "** ( Master Science)
>
> -ඇරිස්ටෝටල්-

දේශපාලන විද්‍යාව සම්බන්ධ ඉහත නිර්වචනයන් මතින් ම එහි ඇති වැදගත් බවය. එය අධ්‍යයන කිරීමේ ප්‍රයෝජන උපයෝගීතාව ප්‍රමාණය කළ හැකිය. එමෙන්ම තව දුරටත් ඇරිස්ටෝටල් ප්‍රකාශ කරනු ලබන්නේ ,

> "මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන ජීවියෙකි."
> Man is by nature a Political animal

ඉහත ආකාරයට දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් වන අතර මිනිසා දේශපාලන ජීවියෙකු වේ. **සමාජය තුළ ජීවත් වන දේශපාලන ජීවියකු වන මිනිසා දේශපාලන විද්‍යාව අධ්‍යනය කිරීම හරහා අත්පත් කර ගත හැකි ප්‍රයෝජන රාශියකි.**

කරුණු

**01. දේශපාලන න්‍යාය , දර්ශනය, චින්තනය හා මතවාද පිළිබඳ මිනිසා සතු දැනුම වර්ධනයවීම.**
(N.B -: දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය Tute බලන්න.)

**දේශපාලන න්‍යාය** යනු ප්‍රත්‍යක්ෂ (තහවුරුකරගත්) සාධක හා දත්ත මත දේශපාලන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ගොඩනගා ඇති මූලධර්මයන් ය. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම මගින් දේශපාලන න්‍යාය සම්බන්ධයෙන් මිනිසා සතු දැනුම හා අවබෝධය වර්ධනය වේ.

**නිදර්ශන ,** දේවවරම් වාදය , සමාජ විකාශන වාදය . සමාජ සම්මුති වාදය , ලිබරල් වාදය , මාක්ස් වාදය , ෆැසිස්ට් වාදය , මාවෝ වාදය , ට්‍රොස්කි වාදය , ස්ටාර්ලින් වාදය , කැස්ත්‍රෝ වාදය , බලවාදය , මැකියා වේලියානු වාදය වැනි දේශපාලන න්‍යායන් සහ ඒවා උත්පාදනයට බලපෑ සමාජ , ආර්ථික , දේශපාලනික තත්ත්වයන් සහ න්‍යායන් ඉදිරිපත් කළ දාර්ශනිකයන් සම්බන්ධයෙන් අවබෝධය ලබා ගැනීමට හැකිවීම.

දේශපාලන දර්ශනය යනු, දාර්ශනිකයන් විසින් ඉදිරිපත් කළ පරමාදර්ශනයන් ය. විවිධ දාර්ශනිකයන් විසින් නිර්මාණය වුවහොත් හොඳයැයි කල්පනා කරමින් ඉදිරිපත් කළ මිහිපිට නිර්මාණය නොවූ පරමාදර්ශී කල්පිත තත්ත්වයන් දේශපාලන විද්‍යාව තුළ තිබේ. ඒ අනුව දේශපාලන දර්ශනය යනු කල්පිත , මනෝමූලික , සිතින් මවාගත් නිශ්ටාවයන්ය. ඒ පිළිබඳ දැනුම හා අවබෝධය ලබාගතහැකිවීම දේශපාලන විද්‍යාව ඉගෙනීමේ ප්‍රයෝජනයකි.

නිදර්ශන , ප්ලේටෝගේ පරමාදර්ශී රාජ්‍ය හා දාර්ශනික පාලකයා
රූසෝගේ පොදු කැමැත්ත
කාල් මාක්ස්ගේ විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය
තෝමස් මෝර්ගේ උටෝපියානු කොමියුනිස්ට් ක්‍රමය

<u>දේශපාලන චින්තය යනු</u> , දේශපාලන ක්‍රමයක ක්‍රියාකාරීත්වය සහ එයින් මිනිසාට වන බලපෑම පිළිබඳව ඒ ඒ කාලයන් හිදී ජීවත් වූ දේශපලන විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කළ අදහස් වේ. ග්‍රීක අවධියේ පටන් නූතන අවධිය දක්වා දේශපාලන චින්තය පෝෂණය කළ දාර්ශනිකයන්

| | | | |
|---|---|---|---|
| නිදර්ශන , | ග්‍රීක යුගයේදී | - | සොක්‍රටීස් , ප්ලේටෝ , ඇරිස්ටෝටල් |
| | රෝම යුගයේදී | - | සෙනෙකා , සිසරෝ , පොලිබීසියස් , . . . . . . |
| | මධ්‍යතන යුගයේදී | - | ශාන්ත පෝල් , ශාන්ත ඔගස්ටින් , . . . . . . . |
| | නූතන යුගයේදී | - | මැකියාවේලි , ජෝන් ලොක් , තෝමස් හොබ්ස් . . . . . |

<u>දේශපාලන මතවාද යනු ,</u> ජීවිතය , සමාජය , ආණ්ඩුව වැනි සංකල්ප පිළිබඳ සමස්ත සමාජය විසින් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් හෝ දේශපලන පක්ෂ විසින් පිළිගෙන ඇති ඒකීය අදහස් මාලාව කි.

නිදර්ශන , ලිබරල්වාදී මතධාරීන් හා ලිබරල්වාදී පක්ෂ
මාක්ස්වාදී මතධාරීන් හා මාක්ස්වාදී පක්ෂ
ෆැසිස්ට්වාදී මතධාරීන්
රැඩිකල්වාදීන්

දේශපාලන න්‍යාය , දර්ශනය , චින්තනය , මතවාදයන්ට අදාල දේශපාලන විද්‍යාව තුළ හඳුනාගත හැකි පදනම් ග්‍රන්ථ ද අදාළ වේ. ඒ අනුව <u>ඇරිස්ටෝටල්ගේ "දේශපාලනය" , පේලේටෝගේ "සමූහාණ්ඩුව" , මැකියාවේලිගේ "කුමාරයා" , තෝමස් මෝර්ගේ "උටෝපියා" , ජෝන්ලොක් ගේ "සිවිල් ආණ්ඩුව පිළිබඳ ප්‍රවාදයන් දෙකක්" , මොන්ටෙස්ක්‍යුගේ "නීතියේ සාරය" ආදී වූ ශාස්ත්‍රීය ග්‍රන්ථ පෙන්වාදිය හැකිය.</u>

**02. දේශපාලන න්‍යාය , දර්ශනය, චින්තන හා මතවාද පිළිබඳ නව දැනුම සොයා යාමේ ආශාව වර්ධනය වීම.**

දේශපාලන විද්‍යාව අධ්‍යයනය මගින් දේශපාලන න්‍යාය , දර්ශනය , චින්තය , මතවාද පිළිබඳ මානවයා දැනුම ලබාගනී. එහි ද්විතීක උත්තේජනය බවට පත්වන්නේ එම මුල් අවස්ථාවේ ලබාගත් දැනුම මගින් නව දැනුම සොයා යාම සඳහා මිනිසා පෙළඹීමයි. මේ ආකාරයට ද්විතීක තත්ත්වයේදී දේශපාලන න්‍යාය , දර්ශනය , චින්ත , මතවාද සම්බන්ධ දැනුම පුළුල් කර ගැනීමට මිනිසා ආශා කරයි. ඒ හරහා නව න්‍යායන් , නව දර්ශනයන් , නව චින්තනයන් , නව මතවාදයන් , නව තර්ක විතර්ක සංවාදයන් හා කතිකාවත් උත්පාද වෙයි. එය ද දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ප්‍රයෝජනයකි.

**03. යහපත් පුරවැසියකු වීමට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා ගැනීම.**

යහපත් පුරවැසියෙකුවීමට අදාළ දැනුම හා පුහුණුව වෙනත් විෂයක් අධ්‍යයනය කරන්නෙකුට සාපේක්ෂව දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරන්නෙකුට ලබා ගැත හැකිය. <u>"යහපත් පුරවැසියෙකු"</u> යනුවෙන් සංකේතවත් වන්නේ කෙබඳු පුද්ගලයකු දැයි සහටහන් කළ යුතුය. දේශපාලන විද්‍යාව තුළදී අප ඊට ලබාදෙන අර්ථය වන්නේ සමාජ පැවැත්මට බාධාකාරී නොවූ පුරවැසියා යන්න වේ. මෙවැනි පුරවැසියෙකු ලෙස ජීවත්වීමට අවශ්‍ය දැනුම හා පුහුණුව දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම තුළින් ලැබේ.

නිදර්ශන ජීවීන් අතර ගැටුම් ඇතිවන ප්‍රධාන ආශාවන් තුනක් ඇරිස්ටෝටල් විසින් පෙන්වා දෙයි. ධනය පිළිබඳ ආශාව , බලය පිළිබඳ ආශාව , ලිංගිකත්වය පිළිබඳ ආශාව

සාමූහික සමාජය තුළ ජීවත් වන සහජයෙන්ම රැගෙන එන අතෘප්ත කර ආශාවන් තෘප්තිමත් කර ගැනීමට උත්සාහ දැරීමේදී ගැටුම නියත දෙයකි. එම ආශාවන් ගැටුමකින් තොරව අයිතිවාසිකම් , නිදහස කඩවීමකින් තොරව සාධාරණව හා සාමකාමීව ඉටුකර ගැනීමට අදාළ ඥානය දේශපාලන විද්‍යාව අධ්‍යනය කරන්නෙකුට වෙනත් විෂයක් අධ්‍යයනය කරන්නෙකුට සාපේක්ෂව ලබාගත හැකිය. එය දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ප්‍රයෝජනයකි.

නිදර්ශන රාජ්‍ය නීතියට අවනතවීම , රාජ්‍ය නීතියට ගරු කිරීම , රාජ්‍යයේ නීතිය හා සාමයට හානි නොවන පරිදි ක්‍රියා කිරීම , රාජ්‍යය වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් ඉටු කිරීම වැනි දේ සම්බන්ධයෙන් පුද්ගලයන්ට අවබෝධයක් සහ පුහුණුවක් ලබාගත හැකිවීම.

**04. යහපත් , පරිපූර්ණ රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වීමට අදාළ දැනුම හා පුහුණුව ලබාගත හැකිවීම.**

දේශපාලන විද්‍යාව අධ්‍යනය කිරීම හරහා යහපත් පරිපූර්ණ රාජ්‍ය තාන්ත්‍රිකයෙකු විය හැකිය. දේශපාලන විද්‍යාව තුළදී රාජ්‍යය තාන්ත්‍රිකයෙකු විසින් දැන සිටිය යුතු දේශපාලන න්‍යාය , දේශපාලන දර්ශනය , ආණ්ඩුක්‍රම ආකෘතීන් , දේශපාලන ආයතන , දේශපාලන චර්යාවන් , අන්තර් ජාතික සංවිධාන , අන්තර් ජාතික නීතිය , අන්තර් ජාතික සම්බන්ධතා , විදේශීය ප්‍රතිපත්ති , අන්තර් ජාතික රැගුම් කරුවන් , කළාපීය බලවතුන් , ලෝක බලවතුන් , ආර්ථික සම්බාධක , රාජ්‍ය උපාය මාර්ග වැනි පුළුල් ක්ෂේත්‍රයක විශාල දැනුමක් එක් රැස් කරගතහැකිය. එම නිසා දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරන්නෙකුට යහපත් පරිපූර්ණ රාජ්‍ය තාන්ත්‍රිකයෙකු බවට පත්වීමට අදාළ දැනුම ලැබෙයි.

**05. ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලැබීම.**
(**N.B** -: අන්තර්ජාතික දේශපාලනය Tute බලන්න.)

ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ අවබෝධයක් ලැබීමට හැකිවීම දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම තවත් ප්‍රයෝජනයකි.

ජාතික දේශපාලනය යනු , ස්වකීය රාජ්‍යයේ නැතිනම් තම රටේ දේශපාලනය යයි. ස්වකීය රාජ්‍යයේ දේශපාලනය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම ජාතික දේශපාලය ඉගෙනීම වේ. නූතන ජාතික රාජ්‍ය ක්‍රමය යටතේ සෑම පුරවැසියෙකුම කුමන හෝ ජාතික රාජ්‍යයක සාමාජිකයෙකු වේ. එම නිසා ජාතික දේශපාලනය ගැන අවබෝධයක් ලබාගැනීම වැදගත් වෙයි.

**නිදර්ශන ,** ස්වකීය රාජ්‍යයේ ක්‍රියාත්මක වන දේශපාලන න්‍යාය , ස්වකීය රාජ්‍යයේ ආණ්ඩුක්‍රමය , ස්වකීය රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ , ස්වකීය රාජ්‍යය විසින් පිළිගත් විදේශ ප්‍රතිපත්ති , ස්වකීය රාජ්‍යයේ නියෝජන ක්‍රම , බලපෑම් කණ්ඩායම් , ස්වකීය රාජ්‍යයේ ක්‍රියාත්මක වන විකල්ප දේශපාලන මතවාද , ස්වකීය රාජ්‍යයේ ක්‍රියාත්මක වන වාර්ගික භාෂාමය ආගමික වාර්ණික කුලමය කරුණු දේශපාලනයට බලපාන ආකාරය වැනි තත්ත්වයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීම සඳහ දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම මගින් හැකිය.

ජාත්‍යයන්තර දේශපාලනය යනු , ස්වකීය රාජ්‍යයේ දේශපාලනය ඔබ්බෙහි ඇති දේශපාලනයවේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් අනෙකුත් රාජ්‍යයන්ගේ දේශපාලනය අන්තර්ජාතික දේශපාලනය ලෙස හැඳින්වේ. අතීතයේදී මෙය **රාජ්‍ය උපාය මාර්ග** නමින් හැඳින්වී ය. එක් ජාතියකට එක් රාජ්‍යයක් යන න්‍යායාත්මක පදනම මත නිර්මාණය වී ඇති ජාතික රාජ්‍ය ක්‍රමය යටතේ ජාත්‍යන්තර දේශපාලනය ඉතා වැදගත් කථිකාවතක් බවට නූතනය වන විට පත්ව තිබෙයි. එය එසේ වීමට හේතු

(i) ජාතික දේශපාලනයට අන්තර්ජාතික දේශපාලයෙන් මිදීමට හැකි නොවීමත්
(ii) අන්තර්ජාතික දේශපාලනය ජාතික දේශපාලනය මතින් නිර්මාණයවීම.

ඉහත ආකාරයට දේශපාලන විද්‍යාව අධ්‍යයනය මගින් ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය සම්බන්දයෙන් පුළුල් අවබෝධයක් ලබාගත හැකිය.

**06.** **දේශපාලන සමාජයක් තුළ ක්‍රියාකාරී හා විචාරශීලී දේශපාලන ජීවිතයක් ගත කිරීමට අවස්ථාව හිමි වීම. (දේශපාලන සමාජානුයෝජනය සඳහා)**

දේශපාලන සමාජයක් තුළ ක්‍රියාකාරී දේශපාලන ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසාට දේශපාලන දැනුමක් අවශ්‍ය වේ. මිනිසා දේශපාලන ඥානය විධිමත්ව හා අවධිමත් ක්‍රම මගින් ලබාගනී. ක්‍රියාකාරී දේශපාලන ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය වන්නේ විධිමත් දේශපාලන ඥානය යි. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම මගින් එම විධිමත් දැනුම ලබාගත හැකිය. ඒ අනුව දේශපාලන සමාජානුයෝජනයට අදාළ දැනුම දේශපාලන විද්‍යාව මගින් ලැබෙයි. එමගින් දේශපාලන සමාජයක් තුළ සක්‍රීය පුරවැසියෙකු ලෙස ස්වකීය හැසිරීම් පවත්වාගත හැකිය. එය දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කමකි , අරමුණකි , ප්‍රයෝජනයකි , උපයෝගිතාවයකි.

**07.** **දේශපාලන ක්‍රමයේ ඇතැම් තනතුරු දැරීම සඳහා අවශ්‍ය විෂය දැනුම හා ශිල්පීය දැනුම ලබා ගත හැකිවීම.**

ඇතැම් තනතුරු , වෘත්තීන් දැරීමට අවශ්‍ය විෂය දැනුම හා ශිල්පීය ඥානය දේශපාලන විද්‍යාව අධ්‍යයනය මගින් ලබාගතහැකිය. වෙනත් ඕනෑම විෂයක් අධ්‍යයනය කරන්නෙකුට සාපේක්ෂව දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරන්නෙකුට පරිපූර්ණ රාජ්‍යතාන්ත්‍රිකයෙකු , පරිපූර්ණ නීතීඥවරයෙකු , පරිපූර්ණ දේශපාලඥයෙකු , පරිපූර්ණ පාලකයෙකු , පරිපූර්ණ සිවිල් නිලධාරියෙකු වීමට අවකාශය පවතී.

**08.** **මූලික අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ දැනුම ලැබීම.**
(**N.B** - ප්‍රජාතන්ත්‍රවාදය **Tute** බලන්න.)

දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම මගින් වෙනත් ඕනෑම විෂයක් අධ්‍යයනය කිරීමට සාපේක්ෂව අයිතිවාසිකම් හා යුතුකම් සම්බන්ධයෙන් අවබෝධයක් ලැබෙයි. අයිතිවාසිකම් යනු කුමක්ද? අයිතිවාසිකම් හි ප්‍රබේද මොනවාද? අයිතිවාසිකම් භුක්තිවිඳිය යුත්තේ කෙසේද? අයිතිවාසිකම් කඩවූ පසු කුමක් කළ යුතුද? අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? අයිතිවාසිකම් හා යුතුකම් අතර ඇති බැඳියාව කුමක්ද? ආදි වශයෙන් අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශාල අවබෝධයක් ලබාගත හැකිය. අයිතිවාසිකම් හා යුතුකම් සම්බන්ධ පැතුරුණු අවබෝධයක් පැවතීම මගින් තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකිය. එය දේශපාලන විද්‍යාව අධ්‍යයන කිරීමේ ප්‍රායෝජනයකි.

- දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම, අරමුණු, උපයෝගීතාවය , ප්‍රයෝජන සම්බන්ධයෙන් පළවී ඇති <u>දාර්ශනික මතවාද</u>

විවිධ දාර්ශනිකයන් විසින් දේශපාලන විද්‍යාව අධ්‍යයන කිරීමේ වැදගත්කම් සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර තිබේ. "දේශපාලන සිද්ධාන්ත" ( Political Theorey ) කෘතියේදී ආර්.සී. ආග්‍රාවුල් ( R.C Agrawal ) නම් ඉන්දියානු චින්තකයා ඉදිරිපත් කළ අදහස වන්නේ,

> **"රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ ඉගෙනීමට සමාගම් හා ආයතන පිළිබඳ ඉගෙනීමට , මිනිසාගේ ජාතික හා ජාත්‍යන්තර ප්‍රශ්න පිළිබඳ ඉගෙනීමට හා රාජ්‍යයේ අතීත , වර්තමාන , අනාගතය පිළිබඳ ඉගෙනීමට හැකිවීම."**

# මිනිසා දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය

....................................................................................................

....................................................................................................

....................................................................................................

## මිනිසා දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය

ප්‍රවේශය

දේශපාලන විද්‍යාවේ නිර්මාතෘ ග්‍රීක මහා දාර්ශනික ඇරිස්ටෝටල්ට අනුව ,

"මිනිසා ස්වභාවයෙන් ම දේශපාලන ජීවියෙකි."
Man is by nature a Political Animal

ස්වභාවයෙන් ම දේශපාලන ජීවියෙකු වන මිනිසාට දේශපාලනය උගැන්ම සම්බන්ධයෙන් ඇති වන ආශාව , අතිශයින්ම ස්වභාවික වූවකි. සහජයෙන්ම දේශපාලන දැනුම සහිත ජීවියා උත්පාදයෙන් පසු ද්විතීක තත්ත්වය තුළදී ස්වකීය දේශපාලන දැනුම ප්‍රවර්ධනය කර ගනී. මිනිසාගේ දේශපාලන චර්යා , හැසිරීම් , තීරණ , සංස්කෘතිය , සාරධර්ම , අගයකිරීම සඳහා මිනිසා සතු දේශපාලන දැනුම බලපානු ලබයි. දේශපාලනය ඉගෙනීම මගින් මිනිසා දේශපාලන ක්‍රමයට මුහු විය හැකිය. එය දේශපාලන විද්‍යා භාෂාත්මක සංකේත වලින් දක්වන්නේ නම් දේශපාලනය සමාජානුයෝජනය (Plitical Sacialaization ) නම් වේ.

කරුණු

- **මිනිසාට දේශපාලන දැනුම ලැබෙන ප්‍රධාන ක්‍රම දෙකකි.**

01. විධිමත් ක්‍රමය } **Formal Studies of Politial**

02. අවිධිමත් ක්‍රමය } **Informal Studies of Politial**

### 01 විධිමත් ක්‍රමය

හැඳින්වීම

විධිමත්ව දේශපාලනය ඉගෙනුම යනු විෂයානුබද්ධ ශාස්ත්‍රාලීය පදනමකින් දේශපාලනය ඉගෙනීමයි. දේශපාලන විද්‍යාව විෂයක් ලෙස අධ්‍යනය කිරීම විධිමත්ව දේශපාලනය ඉගෙනීමකි.

විධිමත් ක්‍රමයේ ලක්ෂණ

1. **දේශපාලනය විෂයානු බද්ධව ඉගෙනීම.**

   දේශපාලනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගෙනීම මින් අර්ථවත් වේ. මෙය විධිමත් ක්‍රමයේ මූලිකම ලක්ෂණය ලෙස දැක්විය හැකිය.

2. **ක්‍රමාණුකුල දේශපාලනය ඥානයක් ලැබීම.**

   විධිමත් ක්‍රමය මගින් දේශපාලන දැනුම ක්‍රමානුකූලව ලැබෙයි. නිදර්ශන ලෙස දේශපාලන විද්‍යා පාඨමාලාවක් සකස් කරණු ලබන්නේ දේශපාලන මූලිකාංග වල සිට විකාශනය වන විධිමත් ක්‍රමානුකූල පදනමකිනි. එමනිසා එමගින් ක්‍රමානුකූල දේශපාලන ඥානයක් ලැබෙයි. තවදුරටත් දේශපාලන සංකල්ප වන රාජ්‍යය , ආණ්ඩුව , විධික්‍රම , නීතිය , නිදහස , අයිතිවාසිකම් , සමානාත්මතාවය , ගැටුම් , ආණ්ඩුක්‍රමය , ස්වාධිපත්‍ය , බලබෙදීම වැනි සංකල්පයන් හි ප්‍රභවය , ඉතිහාසය , විකාශනය , වැදගත්කම් , දුර්වලතාවයන් විධිමත් ක්‍රමානුකූල පදනමකින් අධ්‍යයනය කිරීම මගින් ක්‍රමානුකූල දැනුමක් හිමිවේ.

3. **න්‍යායාත්මක තත්ත්වය සම්බන්ධව වැඩි අවධානයක් යොමු කිරීම.**

රාජ්‍ය , ආණ්ඩුව , ස්වාධිපත්‍ය , බලතල බෙදීම , ආණ්ඩුක්‍රම , නිදහස , අයිතිවාසිකම් , යුතුකම් ,සමානාත්මතාවය , නීතිය වැනි සංකල්ප වල න්‍යායාත්මක පදනම පුළුල්ව අධ්‍යයනය කිරීම.

4. **විධිමත් මූලාශ්‍ර මගින් දැනුම ලබාගැනීම.**

විධිමත් දේශපාලන ඥානය ලබාගතහැකි මූලාශ්‍ර ලෙස, **පාසල , විශ්ව විද්‍යාල , පාඨශාලා , ඇකඩමි** දැක්විය හැකිය. තවදුරටත් විධිමත් දැනුම ලැබෙන මූලාශ ලෙස දේශපාලන විද්‍යා විෂයට අදාළ ග්‍රන්ථ ද හඳුනාගත හැකිය. නිදර්ශන ලෙස , **දේශපාලනය , සමූහාණ්ඩුව , නීතියේ සාරය , කුමාරයා . යුධ කලාව , ප්‍රාග්ධනය** වැනි ග්‍රන්ථ

5. **නියමිත කාලරාමුවට අනුව ඉගැන්වීම.**

මෙයද විධිමත් ක්‍රමයේ තවත් ලක්ෂණයකි. නියමිත කාලරාමුවකට අනුව දේශපාලන දැනුම ලබාදීම විධිමත් ක්‍රමයේ ලක්ෂණයකි. නිදර්ශන ලෙස උසස් පෙළ දේශපාලන විද්‍යා විෂය නිර්දේශය වසර දෙකක් තුළ ඉගැන්වීම. විශ්ව විද්‍යාල තුළ වසර තුනක් හෝ වසර හතරකට අදාලව සකස් කළ විෂය නිර්දේශයක් පැවතීම.

6. **සරල තැන සිට සංකීර්ණත්වය කරා පෙළ ගැසැනු පාඩම් ක්‍රමය.**

7. **ගුරුවරු දේශකවරු හරහා දැනුම ලබාගැනීම.**

<u>විධිමත් ක්‍රමය තුළ ඇති අවිධිමත් ලක්ෂණ</u>

විධිමත් ක්‍රමය තුළ හඳුනාගත හැකි අවිධිමත් ලක්ෂණ කිහිපයකි.

1. **දේශකයාගේ පෞද්ගලික දේශපාලන මතවාද වලින් ශ්‍රාවකයන් අන්තර් පෝෂණය ලැබීම.**

2. **ප්‍රායෝගිකත්වය නියමාකාරව ස්පර්ශ කිරීමට නොහැකිවීම.**

## 02. අවිධිමත් ක්‍රමය

<u>හැඳින්වීම</u>

අවිධිමත්ව දේශපාලනය ඉගෙනුම යනු විෂයානුබද්ධ ශාස්ත්‍රාලීය පදනමකින් බැහැරව දේශපාලනය ඉගෙනීමයි.

<u>අවිධිමත් ක්‍රමයේ ලක්ෂණ</u>

1. **දේශපාලනය විෂයානු බද්ධතාව අධ්‍යයනය නොකිරීම.**

අවිධිමත් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ විෂයානුබද්ධ ශාස්ත්‍රාලිය පදනමින් ඈත්වී දේශපාලනය ඉගෙන ගැනීමයි.

2. **ක්‍රමාණුකූල දේශපාලනය ඥානයක් නොලැබීම.**

අවිධිමත් ක්‍රමය මගින් ක්‍රමානුකූල දේශපාලන ඥානයක් , දැනුමක් හිමි නොවෙයි. නියමිත විෂය නිර්දේශයක් නොමැතිවීම සහ නියමිත කාල රාමුවක් නොමැති වීම වැනි තත්ත්වයන් ඊට හේතු ලෙස හඳුනාගතහැකිය.

3. **ප්‍රායෝගිකත්වය සම්බන්ධ වැඩි අවධානක් යොමු කිරීම.**

න්‍යායාත්මක කරුණු වලට වඩා ප්‍රායෝගිකත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු වීම අවිධිමත් ක්‍රමයේ ලක්ෂණයකි.

නිදර්ශන : ආණ්ඩුවේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සම්බන්ධ වැඩි අවධානයක් යොමු කිරීම පෙන්වාදිය හැකි න්‍යායාත්මක තත්ත්වයෙන් ඇත් වූ ප්‍රායෝගික තලය තුළදී ආණ්ඩුව ලෙස සලකනු ලබන්නේ විධායකය පමණි.

4. **අවිධිමත් මූලාශ්‍ර මගින් දැනුම ලබා ගැනීම.**

අවිධිමත් මූලාශ්‍ර මගින් දේශපාලන දැනුම ලබාගැනීම අවිධිමත් ක්‍රමයේ තවත් ලක්ෂණයකි. නිදර්ශන ලෙස පවුල , **ආණ්ඩුව ,සමාජ සංවිධාන , දේශපාලන පක්ෂ , පාලකයින් , දේශපාලනඥයින් , ජනමාධ්‍ය** , වැනි මූලාශ්‍රයන් දැක්විය හැකිය.

5. **කාල රාමුවකින් බැහැරව දැනුම ලබා ගැනීම.**

6. **ගුරුවරු දේශකවරුන්ගෙන් බැහැරව දැනුම ලබාගැනීම.**

<u>අවිධිමත් ක්‍රමය තුළ ඇතැම් විට විධිමත් ලක්ෂණයන් ද හඳුනාගත හැකිය.</u>

1. **යම් නිශ්චිත කාලරාමුවකට අනුව විෂයානුබද්ධ මට්ටමකින් දේශපාලනය ඉගැන්වීම.**
උදා : ලෝක සමාජවාදී දේශපාලන ක්‍රම.

ඉහත පරිදි විධිමත්ව හා අවිධිමත්ව මිනිසුන් දේශපාලන ඥානය දැනුම රැස්කර ගනී. පුද්ගලයාගේ දේශපාලන හැසිරීම් , චලනයන් , ගතිගුණ , විශ්වාසය , සාරධර්ම, අගය කිරීම් වලට පදනම වන්නේ විධිමත්ව හා අවිධිමත්ව ලබාගන්නා දේශපාලන ඥානය යි. මිනිසාගේ දේශපාලන දැනුම දේශපාලන සමාජානුයෝජනය ද බලපායි.

<u>දේශපාලන දැනුම වැඩි හා අඩු මිනිසා</u>

විධිමත් හා අවිධිමත් ක්‍රම මගින් මිනිසා දේශපාලන දැනුම ලබාගනී. **<u>දේශපාලන ඥානය අඩු හා වැඩි මිනිසුන් අතර පවතින වෙනස්කම් රාශියකි.</u>**

| දේශපාලන ඥානය වැඩි මිනිසා | දේශපාලන ඥානය අඩු මිනිසා |
|---|---|
| 1. ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය මගින් පුද්ගලයාට වන බලපෑම පිළිබඳ අවබෝධය ඉහළ මට්ටමක පැවතීම. | 1. ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය මගින් පුද්ගලයාට වන බලපෑම පිළිබඳ අවබෝධය අවම මට්ටමක පැවතීම. |
| 2. දේශපාලන සහභාගීත්වය ඉහළ මට්ටමක පැවතීම. | 2. දේශපාලන සහභාගීත්වය පහළ මට්ටමක පැවතීම. |
| 3. දේශපාලන තොරතුරු රැස්කිරීමේ ආශාව ඉහළ මට්ටමක පැවතීම. | 3. දේශපාලන තොරතුරු රැස්කිරීමේ ආශාව පහළ මට්ටමක පැවතීම. |
| 4. දේශපාලන සාකච්ඡා වලට සහභාගී වන ප්‍රමාණය ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම. | 4. දේශපාලන සාකච්ඡා වලට සහභාගී වන පහළ මට්ටමක පැවතීම. |
| 5. දේශපාලන සංවිධානවල වැඩ කටයුතු වලට සක්‍රීයව දායකවීම. | 5. දේශපාලන සංවිධානවල වැඩ කටයුතු වලට සක්‍රීයව දායක නොවීම. |
| 6. දේශපාලන කරුණු සම්බන්ධ අවබෝධය පුළුල්වීම. | 6. දේශපාලන කරුණු සම්බන්ධ අවබෝධය පටුවීම. |

<u>මිනිසා දේශපාලන දැනුම ලබන මූලාශ්‍ර</u>

## පවුල

පවුල යනු සමාජයේ ප්‍රාථමික ඒකකය යි. මානවයාගේ දේශපාලන අදහස් , භාවිතාවන් , චර්යාවන් , තීරණ කෙරෙහි පවුල තුළින් ලැබෙන දැනුම බලපායි. පවුල මිනිසා අවිධිමත් දේශපාලන දැනුම, ඥානය ලබාගන්නා ප්‍රාථමික මූලාශ්‍රය වේ. පවුල තුළින් ,

- අධිකාරියට අවනතවීම සම්බන්ධ පුහුණුවක් ලැබීම.
- නීතියට අවනතවීම, ගරු කිරීම සම්බන්ධ පුහුණුවක් ලැබීම.
- යුතුකම් ඉටු කිරීම සම්බන්ධ පුහුණුවක් ලැබීම.
- දේශපාලන ඥානයක් (දැනුමක්) ලැබීම.

පවුල තුළ මව පියා වැඩිමහල් සහෝදරයන්ට ඔවුන්ගේ අධිකාරියට (බලයට) අවනතවීම තුළින් ලබන පුහුණුව රාජ්‍යයේ බලයට අවනතවීම දක්වා දීර්ගව ව්‍යාප්ත වෙයි. පවුලේ නීතියට අවනතවීම සම්බන්ධ පුහුණුව රාජ්‍ය නීතියට අවනතවීම දක්වා දීර්ඝව ව්‍යාප්ත වේ. පවුල තුළ යුතුකම් ඉටු කිරීම රාජ්‍යයට යුතුකම් ඉටුකිරීම දක්වා ව්‍යාප්ත වේ. මෙසේ පවුල තුළින් පුද්ගලයා රාජ්‍ය තුළ ජීවත්වීමට අවශ්‍ය දේශපාලන ඥානය හා පුහුණුව මුල් අවස්ථාවේදී ලබාගනී.

## අධ්‍යාපන ආයතන

අධ්‍යාපන ආයතන මිනිසාට විධිමත් දේශපාලන දැනුම ලැබෙන ප්‍රධාන කේන්ද්‍රීය මූලාශ්‍රයක් ලෙස හඳුනාගත හැකිය. මෙම අධ්‍යාපන ආයතන තුළින් ශාස්ත්‍රීය පදනමකින් විෂයානුබද්ධව දේශපාලන ඥානය රැස්කරගත හැකිය. පාසල , විශ්ව විද්‍යාල , ඇකඩමි අධ්‍යාපන ආයතන නිදසුන් ය. පවුල තුළින් ලැබුණු ප්‍රාථමික දේශපාලන ඥානය ද්විතීක තත්වය තුළ විධිමත්ව වර්ධනය වීම ආරම්භ වන්නේ අධ්‍යාපන ආයතන හරහා ලබන දැනුමෙනි. <u>අධ්‍යාපන ආයතන මගින් ආකාර දෙකකට දේශපාලන දැනුම ලැබේ.</u>

**දේශපාලන දැනුම**

**විෂයගත ක්‍රමය** | **විෂය සමගාමී ක්‍රමය**

- **විෂයගත ක්‍රමය යනු ,**
  දේශපාලන විද්‍යාව විෂයක් ලෙස අධ්‍යනය කිරීම මගින් හිමිවන දැනුමයි.

- ජාතික රාජ්‍ය තුළ ජාතික රාජ්‍යයේ සංකේත වන ජාතික ඇඳුම, ජාතික දිනය , ජාතික කොඩිය , ජාතික ගීය , ජාතික වීරයින් , ජාතික ක්‍රීඩාව , ජාතික වෘක්ෂය , ජාතික පුෂ්පය සම්බන්ධයෙන් අධ්‍යනය කිරීම. ඒවාට ගරු කිරීමට පුරුදුවීම මගින් දේශපාලන දැනුම ලබාගත හැකිය.

- අධිකාරියට අවනතවීම සම්බන්ධ පුහුණුව
  මෙය නිදසුනකින් පැහැදිලි කරන්නේ නම්,
  විදුහල්පති → උප විදුහල්පති → අංශ ප්‍රධාන→ ගුරුවරු → ප්‍රධාන ශිෂ්‍යනායක → උප ප්‍රධාන ශිෂ්‍යනායක ආදී වශයෙන් පවතින අධිකාරියට අවනතවීම මගින් ලබන පුහුණුව

- **සාමූහික වාසය තුළින් ලබාගන්න දැනුම ,**
  නිදසුන් :
  ගැටුම් , අයිතීන් , නිදහස , අවනතභාවය ,නීතිය , යුතුකම් , ජයපරාජය

## සමාජ සංවිධාන

මිනිසාට අවිධිමත් දේශපාලන දැනුම ලැබෙන වැදගත් මූලාශ්‍රයක් ලෙස සමාජ සංවිධාන දැක්විය හැකිය. සමාජ සංවිධාන වලට නිදර්ශන

| | | |
|---|---|---|
| දේශපාලන පක්ෂ | : | ( උදා - ශ්‍රී.ල.නි.ප / එ.ජා.ප / හෙළ උරුමය /ලං.ස.ස.ප කොමියුනිස්ට් පක්ෂය / ජ.වි.පෙ ) |
| වෘත්තීය සමිති | : | (උදා - බස් හිමියන්ගේ වෘත්තීය සමිතිය / වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිතිය / ගුරුවරුන්ගේ වෘත්තීය සමිතිය ) |
| ආගමික සංවිධාන | : | ( උදා - බෞද්ධ බලවේග / ක්‍රිස්තු සභාව / පන්සල / මුස්ලිම් පල්ලිය/කිතුණු පල්ලිය) |
| මිත්‍ර සංවිධාන | : | ( ) |

**<u>දේශපාලන පක්ෂ</u>** මිනිසාට දේශපාලන ඥානය ලබාදෙන මූලාශ්‍රයකි , පක්ෂ ප්‍රතිපත්ති අනුගමනය කිරීම, පක්ෂ නායකයන්ගේ ඇසුර , රැස්වීම් වලට සහභාගී වීම , සංවාද වලට සවන්දීම සංවාද කිරීම වැනි කරුණු මත පුද්ගලයාට දේශපාලන දැනුමක් ලැබෙයි. <u>වෘත්තීය සමිති</u> නිර්මාණය කර ගැනීම, වෘත්තීය ක්‍රියා මාර්ග වල නිරතවීම , වෘත්තීය සමිති, රාජ්‍ය , ආණ්ඩුව සමග ඇති කරගනු ලබන ගැටීම් තුලින් ද මිනිසුන් දේශපාලන දැනුමක් රැස්කරගනී.

**<u>ආගම</u>** හා දේශපාලනය අතර ඇති සම්බන්ධතාවය නිසා බොහෝ දේශපාලනික සංසිද්ධීන් වලදී ආගම කේන්ද්‍රීය සාධකයක් වේ.

**<u>මිත්‍ර සංවිධාන</u>** මගින් ගැටුම් සමථකරනය , සාමූහිකත්වය , සහයෝගය වැනි දේශපාලනික වශයෙන් වැදගත් සංකල්ප සම්බන්ධ අවබෝධයක් ලබා දෙයි.

**<u>වෘත්තීය සමිති</u>** දේශපාලන සමාජයක් තුළ මිනිසාට දේශපාලන දැනුම හා පුහුණුව ලබාදෙන වැදගත් මූලාශ්‍රයකි.

## ජනමාධ්‍ය

ජනමාධ්‍ය යනු මිනිසා දේශපාලන දැනුම ලබාගන්නා අවිධිමත් මූලාශ්‍රයකි. ජනමාධ්‍ය මිනිසා දැනුම ලබාගන්නා වේගවත්ම ශක්තිමත්ම සහ කෙටිම ක්‍රියාවලිය වේ. පුවත්පත් , සඟරා , ගුවන්විදුලිය , රූපවාහිනිය , අන්තර්ජාලය ආදිය ජනමාධ්‍යට අදාළ නිදර්ශනයන් ය. ජනමාධ්‍ය මගින් කාලීන දේශපාලන සංසිද්ධීන් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම , ජනතාව ඊට දක්වන ප්‍රතිචාර පෙන්වීම , ප්‍රතිවිරුද්ධ මත ඉදිරිපත් කිරීම රූපවාහිනිය මගින් දේශපාලන සංවාද ප්‍රචාරණය කිරීම ආදිය සිදු කරයි. එමගින් මිනිසාට දේශපාලන දැනුම ලබාගත හැකිය.

## ආණ්ඩුව

ව්‍යවස්ථාදායකය , විධායකය , අධිකරණය යන ත්‍රිවිධ අංශයන් හි ක්‍රියාකාරීත්වය දෙස බලා සිටීම මගින් ද මිනිසාට දේශපාලන දැනුම රැස්කර ගත හැකිය. ව්‍යවස්ථාදායකය නීති සම්පාදනය කරන ආකාරය, විධායකය නීති ක්‍රියාත්මක කරන ආකාරය අධිකරණය විසින් යුක්තිය පසිඳලන ආකාරය විමර්ෂණය මගින් මිනිසාට දේශපාලන දැනුම රැස්කරගත හැකි ය.

# දේශපාලනය යනු කුමක්ද?

# දේශපාලනය යනු කුමක්දැයි හඳුනා ගැනීම.

<u>හැඳින්වීම</u>

දේශපාලනය යනු සමාජමය සංසිද්ධියකි. සමාජය තුළ පවතින එක් සංස්ථාවක් මෙන්ම සමාජයේ එක් පැතිකඩක් ලෙස ද අර්ථ කථනය කළ හැකිය. සමාජමය සංසිද්ධියක් වන දේශපාලනය සම්බන්ධයෙන් පොදු , විශ්වීය , සර්වලෝකී , කේන්ද්‍රීය හැඳින්වීමක් , නිර්වචනයක් දේශපාලන විද්‍යාව තුළ අන්තර්ගත නොවේ. සැබැවින්ම එය ගතික සංකල්පයකි. එක් එක් දේශපාලන විද්‍යා ගුරුකුල විසින් විවිධ අර්ථකථන ඒ සඳහා ඉදිරිපත් කර තිබේ. ග්‍රීක යුගයේ සිට නූතන යුගයේ වර්තමානය දක්වා ඍජු , කේන්ද්‍රීය පිළිතුරක් ලබා නොගත් සංකල්පයක් ලෙස දේශපාලනය හඳුනාගත හැකිය. නමුත් දේශාපලනය යනු කුමක්දැයි අවබෝධයක් ලබාගැනීම සඳහා දේශපලන විද්‍යා ලිඛිත සාහිත්‍යමය මූලාශ්‍ර තුළ ඇති මූලධර්ම අධ්‍යයනය මගින් හැකි වේ.

<u>දේශපාලනය යන වාක් සංකේතයේ ප්‍රභවය සහ එහි සංකේතික අර්ථය</u>

<u>දේශපාලනය ( Political ) යන භාෂාමය වාග් සංකේතයේ ප්‍රභවය</u> ග්‍රීක පෞර රාජ්‍යය හැඳින්වීම සඳහා භාවිතා කළ "පොලිස් (Polis )" යන පදය විකාශනය වීමෙන් උත්පාද වූවකි. Polis යන්නෙහි සංකේතික අර්ථය "නගර පාලනය" වේ. මෙම Polis යන භාෂාමය වාක් සංකේතයේ දිගුවක් ලෙස Political (පොලිටිකල්) යන වාක් සංකේතය දැක්විය හැකිය. පොලිටිකල් යන්නෙහි සංකේතික අරුත දේශපාලන යයි. වෙනත් ආකාරයකින් විග්‍රහ කරන්නේ නම් , "<u>නගර පාලනය</u>" "<u>දේශපාලනය</u>" දක්වා විකාශනය වී ඇත. දේශපාලනය ශාස්ත්‍රීය, විද්‍යාත්මක පදනමකින් , න්‍යායිකව අධ්‍යනය කරනු ලබන්නේ දේශපාලන විද්‍යාව ( Political Science ) නැමති සාමාජීය විද්‍යාව මගිනි. එහි නිර්මාතෘවරයා ග්‍රීක මහා දාර්ශනික **ඇරිස්ටෝටල් ය.**

<u>දේශපාලනයේ ප්‍රභවය</u>

"දේශපාලනය කවදා කොතැනකදී කෙසේ උත්පාද වූයේ දැයි, ප්‍රභවය වූයේ දැයි නිශ්චිතව කාල නීර්නය කළ නොහැකිය. මිනිසාගේ වනචාරී ජීවිතය තුළ සංවිධානාත්මක හා දාර්ශනික තලයකින් නොවුන දේශපාලනය පැවතුනි. එය ප්‍රතක්‍ෂ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත තාර්කික පදනමක් වේ.

> "මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන ජීවියෙකි"
> "Man is by nature Political Animal"
>
> \- ඇරිස්ටෝටල් -

මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන ජීවියෙකු බැව් ඇරිස්ටෝටල් විග්‍රහ කරයි. එම නිසා මිනිසා උත්පාද වූයේ කවදාද? කෙදිනද? එදිනම දේශපාලනය උත්පාද වූ බව උපකල්පනය කළ හැකිය. දේශපාලන ජීවියෙකු වන මිනිසා සහජයෙන්ම දේශපාලන දැනුම සහිතව උපදී. සහජයෙන්ම දේශපාලන ජීවියෙකු වන මිනිසා සහජයෙන්ම රැගෙන එන ආශාවන් තුනක් ඇරිස්ටෝටල් පෙන්වා දෙයි.

- ධනය පිළිබඳ ආශාව
- බලය පිළිබඳ ආශාව
- ලිංගිකත්වය පිළිබඳ ආශාව

උපතින්ම මිනිසා "බලය පිළිබඳ ආශාවකින්" උපත ලබන්නේ නම් පැහැදිලි වන්නේ මිනිසා උත්පාද වූ දා "දේශපාලනය" උත්පාද වූ බවයි. ඒ දේශපාලනය හා බලය අතර ඇති අවියෝජනීය සම්බන්ධතාවය නිසා ය. "**බලය යම් තැනකද එතන දේශපාලනය පවතී. දේශපාලනය යම් තැනකද එතන බලය පවතී යයි.**" යනුවෙන් නියතියක් දේශපාලන විද්‍යාව තුළ පවතී.

වනචාරී ගෝත්‍රික ප්‍රාථමික සමජ තුළ පවා දේශපාලන තීරණ ගත යුතු ආකාරයකින් විසඳාගත යුතු පොදු ගැටළු තිබුණි.

නිදර්ශන

- වාසස්ථාන තනාගන්නේ කෙසේද?
- ආහාර සුරක්ෂිත කරන්නේ කෙසේද?
- වන සතුන් පලවා හරින්නේ කෙසේද?
- අනෙක් ගෝත්‍ර වලින් ආරක්ෂාවන්නේ කෙසේද?
- තම ගෝත්‍රයේ ව්‍යාප්තික සීමාව ආරක්ෂා කරන්නේ කෙසේද?

මෙවැනි සාමූහික තීරණ ගැනීමේ සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ දේශපාලනික හැඩයක් ඉතා පැහැදිලිව හඳුනාගත හැකි ය. ඒ අනුව දේශාපාලනයේ ප්‍රභවය මානවයා මිහිපිට බිහිවූ අවධිය දක්වා විකාශනය වන බව පැහැදැලි වෙයි.

<u>සාමූහික තීරණ ගැනීමේ ක්‍රියාවලිය මුල්වරට සංවිධානාත්මක හා දාර්ශනික තළයකින් ආරම්භ වන්නේ ග්‍රීක පෞර රාජ්‍යය තුළයි.</u> වෙනත් ආකාරයකින් දක්වනනේ නම් සංවිධානාත්මකව දේශපාලනය ගොඩ නැගෙන්නේ ග්‍රීක අවධිය තුළ පෞර රාජ්‍යය කේන්ද්‍රකොට ගෙන ය.

**"දේශපාලන ක්‍රමයන් මුහුණදී ඇති සමාජ ආර්ථික , දේශපාලනික , සංස්කෘතික ප්‍රශ්න අර්බුධ විසඳීම සඳහා කුමක් කළ යුතු ද යන්න ඉදිරිපත් කරනු ලබන විසඳුම් වල සහ ක්‍රියාකාරකම් වල ඇති වෙනස නිසා දේශාපාලනය උත්පාද වේ. "**

<u>දේශාපලනය පැන නගින හේතු</u>

(i) දේශපාලන සමාජ මුහුණ දෙන දේශාපාලන , ආර්ථික හා සමාජ ගැටලු විසඳීම සඳහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් විසින් ඉදිරිපත්කරනු ලබන ප්‍රතිපත්තිමය විසඳුම් අතර පවතින පරස්පරතාවය

(ii) තමන්ගේ මතය හෝ ප්‍රතිපත්තිය වඩාත් නිවැරදිය යන විශ්වාසය පදනම් කොට ගෙන එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිවිරුද්ධ දේශාපාලඥයින් රාජ්‍ය බලය අල්ලා ගැනීමට තරඟ වැදීම.

<u>දේශපාලනය යනු කුමක්දැයි හඳුනා ගැනීමට උපකාරී වන නිර්වචන</u>

පොදු නිර්වචන (සාහිත්‍යමය විවරණයන්)

1. **දේශපාලනය යනු , "දේශපාලනික වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ බල අරගලය ක්‍රියාවට නැංවෙන ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් වේ. "**

   දේශපාලනය හා සමඟ සෘජුව සම්බන්ධ වන්නේ දේශාපලඥයින්ගේ ක්‍රියාකාරකම් හා දේශාපලන පක්ෂවල ක්‍රියාකාරකම් ය.

2. **"දේශපාලනය බල අරගලය හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාදාමය යි."**

3. **"දේශපාලන බලය සඳහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර පවතින අරගලය යි.**

   බලඅරගලය ජාතික මට්ටමින් මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් ද ක්‍රියාත්මක වෙයි. ජාතික මට්ටම තුළ දේශපාලන පක්ෂ හා දේශපාලඥයින් ප්‍රධාන රඟුම් කරුවන් වන අතර ජාත්‍යන්තර තලය තුළ බල අරගයේ ප්‍රධාන රඟුම්කරුවා වන්නේ ස්වාධිපති රාජ්‍යයන් ය.

4. **"දේශපාලනය යනු විවිධත්වය තුළින් පැන නගින ප්‍රතිවිරෝධතාවයන් මත හට ගන්නා බල අරගලය වේ."**

   මෙයින් පැහැදිලි වන්නේ ප්‍රතිවිරුද්ධ මතවාද සහ දේශපාලන ක්‍රියාකාරකම් නොමැති තත්ත්වයක් තුළ සැබෑ දේශපාලනයක් පැවැතිය නොහැකි බවයි.

5. **"දේශපාලනය වූ කලී ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් අතර ගැටීම තුලින් පැනනගින දෙයක් වන අතර ප්‍රත්‍යක්ෂ මූලික සාධක පදනම් කරගත් කලාවක් වේ."**

6. **"දේශය පාලනය කිරීම දේශපාලනය යි."**

   දේශය පාලනය කිරීම දේශපාලනය යැයි පලවී ඇති මතය දේශපාලනය සම්බන්ධයෙන් පළවී ඇති ප්‍රමාණාත්මක නිර්වචනයක් නොවේ. මින් ඔබ්බෙහි දේශපාලනයට අදාළ බොහෝ කරුණු හඳුනාගත හැකිය. වෙනත් ආකාරයකින් දක්වනවා නම් මෙය දේශපාලනය අසම්පූර්ණ ලෙස අර්ථකතනය කිරීමකි.

7. **"දේශපාලනය යනු සාමාජීය ක්‍රියාකාරකමකි"**

   දේශපාලනය ඉස්මතු වන්නේ පුද්ගල අන්තර් ක්‍රියාකාරකම් මගින් ය. බලය මත පදනම්වී සිදු කරනු ලබන පුද්ගල අන්තර් ක්‍රියාකාරකම් වලින් දේශපාලනය ප්‍රකාශයට පත් වෙයි. එම නිසා දේශපාලනය සමාජීය ක්‍රියාකාරකමක් ලෙස ද හඳුනාගත හැකිය.

8. **" දේශපාලන යනු සාමූහික තීරණ ගැනීමේ ක්‍රියාවලිය යි."**

   දේශපාලනය යනු කණ්ඩායම් වල සාමුහික තීරණ ගැනීමේ ක්‍රියාවලිය යි. ඉතා කුඩා ප්‍රමාණයේ සිට ඉතා විශාල කණ්ඩායම් දක්වා මෙය ව්‍යාප්ත වෙයි. නිදසුන් ලෙස පවුලේ සිට ජාත්‍යන්තර ප්‍රජාවක් දක්වා විසිරී යාම පෙන්වා දිය හැකිය. දේශපාලන තීරණ විවිධ මාර්ගවලින් විදහාපෑමට හැකිය. ඒවා නම් ,

   **සාකච්ඡාව ( Discussion )**
   **සම්ප්‍රදාය ( Draditional )**
   **ප්‍රචණ්ඩත්වය ( Violencee )**
   **කේවල් කිරීම ( Boraanining )**

ඉහත ආකාරයට දේශපාලනය සම්බන්දයෙන් පළවී ඇති සාහිත්‍යමය පොදු විවරණයන් මගින් දේශපලනය යනු කුමක්දැයි යම් කිසි අවබෝධයක් ලබාගත හැකිය. දේශපාලනය යනු කුමක්දැයි හඳුන්වාගැනීමට භාවිතා කළ හැකි දාර්ශනික නිර්වචනයන් ද වේ.

දාර්ශනික නිර්වචන

1. **"දේශපාලන යනු සාමූහික මානව ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ ක්‍රමෝපාය යි"**
   -ලෝසන්-

   ලෝසන් දක්වන ආකාරයට මෙවැනි සාමූහික මානව ක්‍රියාකාරකම් සඳහා සංවිධාන ගත වූ වඩාත් සංකීර්ණ ආකෘතිය රාජ්‍යය යි. එය ග්‍රීක පෞර රාජ්‍ය , රෝම අධිරාජ්‍යය , වැඩවසම් රාජ්‍යය හා ජාතික රාජ්‍යය වශයෙන් විකාශනය වෙමින් පවතී.

2. "දේශපාලනය යනු පුද්ගල හා පුද්ගල කණ්ඩායම් අතරේ ඇතිවන බල අරගලයයි."
-නිකලොයි මැකියාවේලි-

ඉතාලි ජාතික නිකලොයි මැකියාවේලි බල දේශපාලනයේ නිර්මාතෘ වරයායි. නැතිනම් බලවාදයේ පියා ය.ඔහු දේශපාලනය හා බලය අතර නූතන සංවාදය නිර්මාණය කළේය. ඉතා පැහැදිලිව මැකියාවේලි ප්‍රකාශ කළේ දේශපාලනය යනු බලය සඳහා කරන අරගලයක් බවයි.

දේශපාලනය යනු බලඅරගලය යි. බල අරගලයක වැදගත් සාධක කිහිපයකි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් දේශපාලනයේදී වැදගත් සාධක කිහිපයකි.

- බලය අල්ලා ගැනීම.
- බලය තහවුරුකර ගැනීම.
- බලය ව්‍යාප්ත කිරීම.

3. "මැක්ස් වෙබර්" නම් සමාජ විද්‍යාඥයා දේශපලනය අර්ථකතනය කරනු ලබන්නේ මෙසේ ය.

"දේශපාලනය යනු බලය සඳහා කෙරෙන බල අරගලයකි."
-මැක්ස් වෙබර්-

4. "හැරල්ඩ් ලැස්වෙල්" නම් නූතන දේශපාලන චින්තකයා දේශපාලනය අර්ථකතනය කරන්නේ මෙසේ ය.

"බලය බෙදාගැනීම සහ එහි ස්වරූපය තීරණය කිරීම සඳහා කෙරෙන අරගලය දේශපාලනය යි."
-හැරල්ඩ් ලැස්වෙල්-

මේ ආකාරයට දේශපාලනය සහ බලය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් හඳුනාගත හැකිය. බලය සම්බන්ධ ආශාව , බලය දැරීම සම්බන්ධ ආශාව දේශපාලනය ලෙස විග්‍රහ කළ හැකිය

5. "ග්‍රිල් ක්‍රිස්ට්" නැමති විචාරකයා දේශපාලන විග්‍රහ කරනු ලබන ආකාරය

"දේශපාලන ස්වභාවයක් ගනු ලබන ආණ්ඩුවේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය දේශපාලන යන පදයේ අදහස වේ. යමකු දේශපාලනය ගැන උනන්දු වනවාය යන්නෙන් අදහස් වන්නේ ආදායම් බදු ප්‍රශ්නයක් , කම්කරු ප්‍රශ්නයක් ව්‍යවස්ථාදායකය සම්බන්ධ ප්‍රශ්න දෛනික දේශපාලනය තුළ පැන නගින ඕනෑම ආකාරයක ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කිරීම වේ."

-ග්‍රිල් ක්‍රිස්ට්-

ග්‍රිල් ක්‍රිස්ට් ගේ මෙම නිර්වචනය තරමක් පැතිරුණු සීමාවක් තුළ ව්‍යාප්ත වෙයි. ආණ්ඩුවේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය දේශපාලනය ලෙස ග්‍රිල් ක්‍රිස්ට් අර්ථකතනය කරනු ලබයි.

ඉහත පරිදි දාර්ශනිකයන් විසින් දේශපාලනය සම්බන්ධ විවිධ අර්ථකතන ඉදිරිපත් කරයි. ඒවා අධ්‍යනය මගින්ද සාමාජීය සංසිද්ධියක් වන දේශපාලනය යනු කුමක්දැයි තව දුරටත් හඳුනාගත හැකිය.

- **"දේශපාලනය" සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ලබාගැනීම සඳහා දේශපාලනය සාර්ව මට්ටමකින් හා ක්ෂුද්‍ර මට්ටමකින් විග්‍රහ කළ යුතුය.**

- **සාර්ව තලයේ දේශපාලනය**
- **ක්ෂුද්‍ර තලයේ දේශපාලනය**

**සාර්ව තලයේ දේශපාලනය** යනුවෙන් විග්‍රහ කරනු ලබන්නේ රාජ්‍යයේ තීරණ ගැනීම ක්‍රියාවලිය වටා සිදුවන සියලුම ක්‍රියාවලීන් ය.

උදා - නීති සම්පාදනය කිරීම , නීති ක්‍රියාත්මක කිරීම , නීති විනිශ්චය කිරීම.

සාර්ව තලයේ දේශපාලනය තුළ අධිකාරී බලය, ස්වාධිපත්‍ය බලය කේන්ද්‍රීය සාධකයක් ලෙස හඳුනාගත හැකිය.

**ක්ෂුද්‍ර තලයේ දේශපාලනය** තුළ විග්‍රහ කරනු ලබන්නේ බලය මත පදනම් වූ ඕනෑම මානව සම්බන්ධතාවයක් දේශපාලන සම්බන්ධතාවයක් වන බවයි. දේශපාලන ස්වරූපය ගත් පුද්ගල සම්බන්ධතාවයක බලය , අධිකාරිය හෝ බලයේ රූපකායන් පවතී. බලයේ රූපකායන් ලෙස , **( බලපෑම් කිරීම, ප්‍රචන්ඩත්වය , බලහත්කාරය , පාලනය , අවනතභාවය, යටත් වීම )**

- **දේශපාලනය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සමාජයක් තුළ ක්‍රියාත්මක වන විවිධ කණ්ඩායම්**

- දේශපාලන පක්ෂ
- බලපෑම් කණ්ඩායම්
- වෘත්තීය සමිති
- දේශපාලඥයින්

- **දේශපාලනය ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය,**

01. ජාතික දේශපාලනය
02. අන්තර් ජාතික දේශපාලනය
    **(N.B** මේවා විස්තර කරන්න. **)**

- **දේශපාලනය කෙරෙහි සෘජුවම බලපානු ලබන සාමාජමය සාධකයන් කිහිපයකි.**

- කුලය
- ජාතිය
- ආගම
- සම්ප්‍රදායන්
- වර්ගය
- වර්ණය
- සිරිත් විරිත්
- ස්ත්‍රී පුරුෂභාවය

මෙම සමාජමය සාධක ඉතා සෘජුව දේශපාලන සඳහා , දේශපාලනයේ හැඩය , මුහුණුවර තීරණය කිරීම සඳහා බලපායි.

- **මිනිසුන් දේශපාලනය ඉගෙනගන්නා ආකාරය ද දේශපාලනය සම්බන්ධ සාකච්ඡාව තුළ අවධානය යොමු කළ යුතු සංවාදයකි.**

දේශපාලනය ප්‍රධාන ආකාර දෙකකට ඉගෙන ගනී.

01. විධිමත් ක්‍රමය.
02. අවිධිමත් ක්‍රමය.

- **මිනිසාගේ දේශපාලනය ඉගෙන ගනු ලබන මූලාශ්‍ර , තැන් , ස්ථාන , ඒජන්තවරුන් ද දේශපාලනය යනු කුමක්දැයි තේරුම් ගැනීම සඳහා වැදගත් ය.**

  - පවුල
  - අධ්‍යාපන ආයතන
  - සමාජ සංවිධාන
  - ජනමාධ්‍ය
  - ආණ්ඩුව

<u>මිනිසා දේශපාලන ක්‍රියාවලියට අනුගත වීමේ ක්‍රියාවලිය දේශපාලන සමාජානු යෝජනය නම් වෙයි.</u> දේශපාලන සමාජානුයෝජනය සඳහා පුද්ගලයා සතු දේශපාලන දැනුම වැදගත් වේ.

# දේශපාලනය විද්‍යාව හඳුනාගැනීම

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

# දේශපාලන විද්‍යාව හඳුනා ගැනීම.

- <u>දේශපාලන විද්‍යාව යනු ,</u>

"දේශපාලන වශයෙන් සංවිධානය වූ සංමාජයක් තුළ මිනිසුන්ගේ පොදු යහපත ගොඩනැගීමට හා වර්ධනය කිරීම උදෙසා කුමක් කෙසේ කළ යුතු ද යන්න විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නා වූ විෂය"

"රාජ්‍ය , ආණ්ඩුව හා ජනතාව යන මූලික ඒකක තුන අතර පවත්නා සම්බන්ධතාවයන්ගේ ස්වරූපය සහ ජනතාවගේ පොදු යහපත වර්ධනය කිරීම උදෙසා වඩාත්ම උචිත වන්නේ කුමන රාජ්‍ය ක්‍රමය ද ? කුමන ආණ්ඩු ක්‍රමයද? සහ කුමන දේශපාන හා ආර්ථික මතවාදයන් ද? ආදිය පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යනය කරන්නා වූ විෂය වේ."

"දේශපාලන ක්‍රම , ඒවායේ ක්‍රියාකාරීත්වය , ඒ කෙරෙහි පදනම් වී ඇති දේශපාලන හා ආර්ථික මතවාද සහ අවසාන වශයෙන් දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වය තුළින් ජනතාවට වන බලපෑම විද්‍යාත්මකව අධ්‍යනය කරන්නා වූ විෂය වේ."

- <u>දේශපාලනය යන පදයේ බිහිවීම දක්වන්න.</u>

- <u>දේශපාලන විද්‍යාව ආරම්භ වූයේ කුමක් සඳහාදැයි දක්වන්න.</u>

- <u>දේශපාලන විද්‍යාවේ ආරම්භය , විකාශනය හා ඒ ඒ යුගයන්හි සාකච්ඡා කළ කරුණු දක්වන්න.</u>

- <u>දේශපාලන විද්‍යාව සාමාජීය විද්‍යාවක් බව දක්වන්න.</u>

- <u>දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය දක්වන්න.</u>

- <u>දේශපාලන විද්‍යාව ඉගෙන ගන්නා මාර්ග (විධි ක්‍රම ) දක්වන්න.</u>

- <u>දේශපාලන විද්‍යාව ඉගෙන ගැනීමේ වැදගත්කම දක්වන්න.</u>

# දේශපාලනය හා දේශපාලන විද්‍යාව

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

# දේශපාලනය සහ දේශපාලන විද්‍යාව

දේශපාලනය යනු දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිසු සමාජයක් තුළ දේශපාලන බල අරගලය ක්‍රියාවට නැංවෙන ප්‍රයෝගික ක්‍රියාදාමය ලෙස හැඳින්විය හැක. මේ සම්බන්ධයෙන් වැදගත් වන්නේ දේශපාලන බල අරගලය සමග සෘජුවම සම්බන්ධ වන දේශපාලඥයින්ගේ සහ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරකම්ය. දේශපාලන ක්‍රමයන් මුහුණදී තිබෙන දේශපාලන , ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීම සඳහා කුමක් කළ යුතු ද යන්න සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ සහ දේශපාලඥයින් ඉදිරිපත් කරන විසඳුම් සහ ක්‍රියාකාරකම් අතර පවතින වෙනස හේතු කොට ගෙනයි දේශපාලනය පැන නගින්නේ. මේ අනුව දේශපාලනය ගැන කථා කිරීමේදී වැදගත් වන්නේ දේශපාලන ක්‍රම මුහුණදී ඇති ප්‍රශ්න සහ ගැටළු , දේශපාලනය පක්ෂ හා දේශපාලඥයින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය විසඳුම් , ඒවා අතර පවතින වෙනස්කම් සහ බල අරගලය තුළින් ඒවා ක්‍රියාවට නැංවීමට දරණ උත්සාහයක යනාදී කරුණු ය. දේශපාලනයේ පදනම වන්නේ මෙම කරුණුය.

දේශපාලන විද්‍යාව යනු දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ මිනිසුන්ගේ පොදු යහපත ගොඩනැගීම හා වර්ධනය කිරීම උදෙසා කුමක් කෙසේ කළ යුතු ද යන්න විද්‍යාත්මක අධ්‍යයනය කරන්නා වූ විෂය ලෙස හඳුන්වා දිය හැක. වෙනත් ආකාරයකට කියනවා නම් දේශපාලන විද්‍යාව වූ කලී රාජ්‍ය , ආණ්ඩුව සහ ජනතාව යන මූලික ඒකක තුන අතර පවත්නා සම්බන්ධතාවයන්ගේ ස්වරූපය සහ ජනතාවගේ පොදු යහපත වර්ධනය කිරීම උදෙසා වඩාත්ම උචිත වන්නේ කුමන රාජ්‍ය ක්‍රමයක් ද , කුමන ආණ්ඩු ක්‍රමයක් ද සහ කුමන දේශපාලනික හා ආර්ථික මතවාදයක් ද යන්න පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනය කරන්නා වූ විෂය ලෙස හඳුන්වා දිය හැකිය. මේ අනුව දේහපාලන විද්‍යාව ගැන කථා කිරීමේදී වැදගත් වන්නේ දේශපාලඥයින් , ඔවුන් නියෝජනය කරන දේශපාලනික පක්ෂ , ඒවායේ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් නොව දේශපාලන දාර්ශනිකයන් , දේශපාලන විද්‍යාඥයින් සහ මෙම සටහනේ මුලින් දක්වා ඇති කරුණු පිළිබඳ ව ඔවුන් ඉදිරිපත් කර ඇති දේශපාලන මතවාද හා න්‍යායන් ය.

දේශපාලනය යන පදය ප්‍රථමයෙන්ම භාවිතයට ගනු ලැබුයේ ග්‍රීක දේශපාලන දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල් විසිනි. Polis යන ග්‍රීක පදය මේ සඳහා යොදගත් අතර එයින් අර්ථවත් වූයේ සමකාලීන ව පැවති ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කරමින් වඩාත් හොඳ රාජ්‍ය ක්‍රමය සහ ආණ්ඩු ක්‍රමය කුමක්ද යන්න සොයා බැලීමය. මෙයාකාරයට ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමයේ දේශපාලනය අධ්‍යයනය කිරීම තුළිනුයි දේශපාලන විද්‍යාව විෂය ආරම්භ වන්නේ. මෙයින් පෙනී යන්නේ ආරම්භක අවස්ථාවේදී එනම් ග්‍රීක යුගයේදී දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර පැහැදිලි වෙනස්කමක් නොතිබූ බවය. මේ තත්ත්වය නව යුගයේ ආරම්භය දක්වාම දැකිය හැකි විය. නමුත් නව යුගයේ ජාතික රාජ්‍යයක් බිහිවීමත් , ඒ ආශ්‍රිතව ජාතික හා අන්තර්ජාතික ක්ෂේත්‍රයේ ඇතිවන බල අරගලයත් හේතු කොටගෙන දේශපාලනය හා දේශපාලන විද්‍යාව යන පද දෙක භාවිතයට ගැනීමේ වෙනසක් ඇතිවන ආකාරය දැකිය හැකි වේ. මේ අනුව දේශපාලනය යන පදය දේශපාලන ක්‍රීඩාවේ ප්‍රායෝගික පැත්ත හැඳින්වීම සඳහා භාවිතයට ගැනෙන අතර දේශපාලන විද්‍යාව යන පදය දේශපාලනයේ න්‍යායාත්මක පැත්ත විද්‍යාත්මකව අධ්‍යයනය කරන විෂය හැඳින්වීම සඳහා භාවිතයට ගන්නා ආකාරය දැකිය හැකිය.

මේ අනුව වර්තමානයේ දේශපාලනය යන පදයෙන් අදහස් වන්නේ දේශපාලන බල අරගලය හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාදාමයයි. වෙනත් ආකාරයට කියනවා නම් දේශපාලන බලය සඳහා විරුද්ධ කණ්ඩායම් අතර පවත්නා අරගලය යි. වෙනත් අකාරයට කියනවා නම් දේශපාලන බලය සඳහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර පවත්නා අරගලය යි. බල අරලය ජාතික සහ අන්තර්ජාතික වශයෙන් දෙයාකාර ස්වරූපයක් ගනී. දේශපාලනය ජාතික වූවද අන්තර්ජාතික වූවද දේශපාලය වූ කලී බලය සඳහා කෙරෙන අරගලය වන අතර එහි අරමුණු වන්නේ බලය අල්ලා ගැනීම , බලය තහවුරු කරගැනීම සහ බලය ව්‍යාප්ත කර ගැනීමට. අන්තර්ජාතික දේශපාලනය තුළ බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවා වන්නේ ස්වාධිපති ජාතික රාජ්‍යයන් ය. දේශීය දේශපාලනය තුළ බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවන් වන්නේ දේශපාලන පක්ෂ සහ දේශපාලඥයින් ය.

**<u>දේශීය වුවද නැතිනම් අන්තර්ජාතික වුවද, දේශපාලන සමාජයක් තුළ දේශපාලනය පැන නගින්නේ හේතු සාධක දෙකක් පදනම් කොට ගෙන ය.</u>**

1. දේශපාලන සමාජය මුහුණ දෙන දේශපාලන, ආර්ථික හා සමාජ ගැටළු විසඳීම සඳහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය විසඳුම් අතර පවතින පරස්පරතාවන්

2. තමන්ගේ මතය හෝ ප්‍රතිපත්තිය වඩාත් නිවැරදි ය යන විශ්වාසය පදනම් කොටගෙන එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිවිරුද්ධ දේශපාලනඥයින් රාජ්‍ය බලය අල්ලා ගැනීමට තරග වැදීම.

**<u>මේ අනුව පෙනී යන දෙය වන්නේ දේශපාලනය යනු විවිධත්ව තුළින් පැන නගින ප්‍රතිවිරෝධතාවන් මත හට ගන්නා බල අරගලය වන බවයි.</u>** මෙයින් එක් දෙයක් පැහැදිලි වේ. ඒ වූ කලී ප්‍රතිවිරුද්ධ මතවාද සහ දේශපාලන ක්‍රියාකාරකම් නොමැති තැනක සැබෑ දේශපාලනයක් පැවතිය නොහැකි බවයි. දේශපාලනය වූ කලී ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් අතර ගැටීම තුළින් පැන නගින දෙයක් වන අතර ප්‍රත්‍යක්ෂමූලික සාධක පදනම් කරගත් කලාවක් වේ. දේශපාලන සමාජයක් තුළ බල අරගලය කරන්නා වූ ආකාරය සහ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර බලය බෙදාහදා ගන්නා ආකාරය පිළිඹිබු කරන්නේ දේශපාලනය මඟිනි.

මීට ඉහතින් දැක්වූ පරිදි දේශපාලන විද්‍යාව යනු **<u>දේශපාලන ක්‍රම, ඒවායේ ක්‍රියාකාරීත්වය. ඒ කෙරෙහි පදනම් වී ඇති දේශපාලන හා ආර්ථික මතවාද සහ අවසාන වශයෙන් දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වය තුළින් ජනතාවට වන බලපෑම විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නා වූ විෂයය වේ.</u>** දේශපාලන විද්‍යාව අවුරුදු තුන්දාහකට ආසන්න කාලයක් මුළුල්ලේ අනුක්‍රමයෙන් විකාශනය වූ දෙයක් වන අතර එම විකාශන ක්‍රියාදාම තුළ කාලීනව ජීවත් වූ දේශපාලන චින්තකයින්, දාර්ශනිකයින් හා විශේෂඥයින් විසින් සමකාලීනව පැවති දේශපාලන ක්‍රම හා දේශපාලන සංසිද්ධීන් අරභයා ඉදිරිපත් කළ පුළුල් අදහස් සම්භාරයකින් එය සමන්විත වේ. එම අදහස් පහත දැක්වෙන ආකාරයට කොටස් හතරකට බෙදිය හැක.

(i) දේශපලෙන න්‍යාය
(ii) දේශපාලන චින්තනය
(iii) දේශපාලන දර්ශනය
(iv) දේශපාලන මතවාද

දේශපාලන න්‍යායන් යනුවෙනක් අදහස් කරන්නේ තහවුරුකරගත් දත්ත සහ සාධක පදනම් කරගෙන දේශපාලන ආයතන වල ක්‍රියාකාරීත්වය හා සම්බන්ධව ගොඩනගා ඇති මූලධර්මයන් ය. දේශපාලන චින්තනය යනුවෙන් අදහස් කරන්නේ දේශපාලන ක්‍රමයක සමස්ථ ක්‍රියාකාරීත්වය සහ එයින් දේශපාලන ජීවිතයට වන බලපෑම පිළිබඳ ව ඒ ඒ කාලයන්හි ජීවත් වූ දේශපාලන චින්තකයින් විසින් ඉදිරිපත් කර ඇති අදහස් ය. දේශපාලන දර්ශනය ගොඩනැගී තිබෙන්නේ පරමාදර්ශී රාජ්‍ය පාලන ක්‍රමයක් පිළිබඳ ව දේශපාලන දාර්ශනිකයින් ඉදිරිපත් කර ඇති අදහස් පදනම් කරගෙන ය. දේශපාලන මතවාද යන්නෙන් අදහස් කරන්නේ ජීවිතය, සමාජය සහ ආණ්ඩුව පිළිබඳව සමස්ථ සමාජය විසින් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් හෝ දේශපාලන පක්ෂයක් විසින් පිළිගෙන ඇති ඒකීය අදහස් මාලාවකි. ඉහත දැක්වූ කොටස් හතරෙන් පළමු කොටස් තුන අතර පැහැදිලි වෙනසක් දැකිය නොහැකි බව සමහර විචාරකයින් පෙන්වා දේ. හේතුව විෂය කරුණු අතින් එම කොටස් තුන අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පැවතීමය.

දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ක්ෂේත්‍රය දෙස බලන විට පෙනී යන දෙය වන්නේ කාලයත් සමග එයට අන්තරගත වන විෂය කරුණු ප්‍රසාරණය වී ඇති ආකාරයයි. ආරම්භක අවස්ථාවේ රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳ පමණක් හැදෑරීමට සීමා වූ දේශපාලන විද්‍යාව මේ වන විට රාජ්‍ය සහ ආණ්ඩුවට අමතරව දේශපාලන බලය, ප්‍රතිපත්ති සම්පාදනය හා කළමණාකරණය, ගැටුම් අධ්‍යයනය හා කළමණාකරණය, අන්තර්ජාතික දේශපාලනය, දේශපාලන ක්‍රියාදාමය හාසම්බන්ධ මූලිකාංග යනාදී අතිශය පුළුල් විෂය ක්ෂේත්‍රයක් කරා විහිදී තිබෙන ආකාරය දැකිය හැකි වේ.

මෙයින් පෙනී යන්නේ කාලීනව සිදුවන දේශපාලන සංසිද්ධීන් සමග එක්ව පෝෂණය වෙමින් සහ ප්‍රසාරණය වෙමින් දේශපාලන විද්‍යාව ඉදිරියට ගමන් කරන ආකාරයයි. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ක්‍රමවේ ද සම්බන්ධයෙන් ද එම තත්ත්වය එයාකාරයෙන්ම දැකිය හැක.

දේශපාලන විද්‍යාව ආශ්‍රිතව දැකිය හැකි මතභේදාත්මක කරුණක් වන්නේ එය විද්‍යාවක් ලෙස සැලකිය හැකි ද? නැති ද? යන්නය. සමහරුන්ගේ මතය වන්නේ දේශපාලන විද්‍යාව විද්‍යාත්මක පදනමක් මත හදෑරිය හැකිය යන්නය. නමුත් සමහරු මේ මතය පිළිගන්නේ නැත.